# University of Kelaniya

## Faculty of Graduate Studies



# FGS 12th Annual Research Symposium



Interdisciplinary Symposium of the Faculty of Graduate Studies (FGS)

**3 – 4 November 2011**



Themes:

- Equity
- Sustainability
- Transformability



Conference Booklet

Faculty of Graduate Studies,
University of Kelaniya,
Dalugama,
Kelaniya.



www.fgs@kln.ac.lk



ද සිල්වා, ඒ. පී. උදයංගනී
සහකාර පුස්තකාලයාධිකාරී කැලණිය විශ්වවිද්‍යාලය

*Paper: Sustainability*

## ශ්‍රී ලංකාවේ රූපවාහිනී මාධ්‍ය ආයතනයන්හි එකතු සංවිධානය පිළිබඳ අධ්‍යයනයක්

වර්තමානය වන විට සන්නිවේදන මාධ්‍ය අතුරින් ඉතා ජනප්‍රිය මෙවලමක් ලෙස රූපවාහිනී මාධ්‍යය සුවිශේෂ ස්ථානයක් හිමි කර ගෙන ඇත. තොරතුරු පිපාසාවෙන් පෙළෙන වර්තමාන සමාජයට අනුකූල වන පරිදි ඉක්මනින් හා වේගයෙන් නිවැරදි ව තොරතුරු සැපයීමට පිටුබලයක් වන පරිදි මාධ්‍ය ආයතන පුස්තකාලයන්හි එකතුව සංවිධානය කර ඇත්තේ කෙසේද යන්න මෙහි දී අධ්‍යයනය කෙරේ.

ශ්‍රී ලංකාවේ රූපවාහිනී මාධ්‍ය ආයතනයන්හි එකතු සංවිධානය පිළිබඳ අධ්‍යයනය තේමාව වූ මෙම පර්යේෂණයේ නියැදිය ලෙස ස්වාධීන රූපවාහිනිය, ජාතික රූපවාහිනිය, සිරස ටීවී, ස්වර්ණවාහිනී, මැක්ස් ටීවී යන ආයතන යොදා ගෙන ඇත. මෙම පර්යේෂණයේ දී ශ්‍රී ලංකාවේ රූපවාහිනී මාධ්‍ය ආයතනයන්හි පුස්තකාල කෙරෙහි අවධානය යොමු කරමින් එහි පුස්තකාල එකතුව පිළිබඳ අධ්‍යයනය කෙරුණි.

සමීක්ෂණ ක්‍රමවේදය යොදා ගනිමින්, ස්තරගත නියැදියට අනුකූල ව ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ ක්‍රමවේදයන් යොදා ගනිමින් ප්‍රාථමික දත්ත රැස් කළ අතර ද්විතීය දත්ත රැස් කිරීමේ දී පොත්, ශබ්දකෝෂ, විශ්වකෝෂ, සඟරා, අන්තර්ජාලය වැනි මූලාශ්‍ර පරිහරණය කරනු ලැබීය.

ප්‍රශ්නාවලි මෙන් ම සමීක්ෂණ යන ක්‍රමවේදයන්ගෙන් ලබා ගත් ප්‍රාථමික දත්ත විශ්ලේෂණයෙන් අවබෝධ වූයේ රූපවාහිනී මාධ්‍ය ආයතන පුස්තකාලයන් ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය එකතුවකින් පමණක් සමන්විත බවය. ඇතැම් පුස්තකාල සතුව පොත්, පුස්තිකා, අත්පත්‍රිකා, සිතියම් වැනි මූලාශ්‍ර පැවතිය ද එම එකතුව සක්‍රීය ව නොපවතින බව හඳුනා ගත හැකිය. වැඩසටහන් පටිගත කිරීමට පට ලබා ගැනීම, ඒවා නැවත භාර දීම, සංරක්ෂිත දර්ශන ලබා ගැනීම ආදියෙහි රූපවාහිනී මාධ්‍ය ආයතනයන්හි උපයෝජකයින් වන නිෂ්පාදකයින්, අධ්‍යක්ෂවරුන්, විධායක නිලධාරීන්, කළමනාකරුවන්, නිවේදකයින් පුස්තකාල ශ්‍රව්‍ය දෘශ්‍ය එකතුව සමඟ පමණක් ගනුදෙනු කිරීමට යොමු වී ඇත. එසේ ම මෙතෙක් නිර්මාණය වී ඇති ප්‍රමිතිගත වර්ගීකරණ ක්‍රම භාවිතයෙන් රූපවාහිනී මාධ්‍ය ආයතනයන් ඉවත් වී ඇති අතර ප්‍රමිතිගත වර්ගීකරණ ක්‍රම අනුසාරයෙන් නිර්මාණය කර ගන්නා ලද විවිධ වර්ගීකරණ ක්‍රම එක් එක් මාධ්‍ය ආයතන යොදා ගන්නා බව දැකගත හැකි විය. ශ්‍රව්‍ය දෘශ්‍ය මූලාශ්‍ර සංවිධානයට ප්‍රමිතිගත වර්ගීකරණ ක්‍රම යෝග්‍ය නොවීම, පුස්තකාල ද්‍රව්‍ය සොයා ගැනීමට එම වර්ගීකරණ ක්‍රම නිවැරදි ව මඟ නොපෙන්වීම යනා දී කරුණු නිසා එම වර්ගීකරණ ක්‍රම වලින් ඉවත් වී ඇති බව අධ්‍යයනයේ දී අනාවරණය විය.

සියලු ම රූපවාහිනී මාධ්‍ය ආයතන පුස්තකාල විසින් විධිමත් ව නිර්මාණය කරන ලද වර්ගීකරණ ක්‍රමවේදයක් භාවිත කිරීම, පුස්තකාල ප්‍රතිපත්ති නිර්මාණය කර ගැනීම තුළින් අවශ්‍ය මානව හා භෞතික සම්පත් සුලභ කර ගැනීම, පුස්තකාල ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයන්ගේ එකතුවක් පමණක් නොව අනෙකුත් පුස්තකාල ද්‍රව්‍යයන්ගේ එකතුවක් නිර්මාණය කිරීම තුළින් කාර්ය මණ්ඩලයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම යනා දී යෝජනා රූපවාහිනී මාධ්‍ය ආයතන පුස්තකාල එකතුව තත්ත්වයෙන් ඉහළ නංවාගැනීම සඳහා ඉදිරිපත් කළ හැකිය.